| 06-12-2025 | උදෑසන මුරලි | ඕම් ශාන්ති | බාප්දාදා | මධුබන් |
|---|---|---|---|---|

**සාරය:** සුමිහිරි දරුවනි, සෙල්ලම් බඩුවක් වැනි වූ මෙම ශරීරය ජීවාත්මය නම් වූ සජීවි යතුරෙන් ක්‍රියාත්මක වේ. තමා ජීවාත්මයක් යයි සැලකූ විට ඔබ නිර්භය වනු ඇත.

**ප්‍රශ්නය:** ශරීරය හරහා තම චරිත රඟපානා අතර ජීවාත්ම පහළට පැමිණෙන නිසා ඒ ජීවාත්ම වලට දිය හැකි නම කුමක්ද?

**පිළිතුර:** රූකඩ. රූකඩ දර්ශනයක දී රූකඩ කිසියම් චරිතයක් රඟ දක්වන්නාක් සේ වසර 5000 ක මෙම නාටකයෙනුත් ජීවාත්ම වන ඔබලා දිගටම පහළට පැමිණියා. පියා දැන් පැමිණ සිටින්නේ රූකඩ වන ඔබලාට නැවතත් ඉහළ නැගීමේ මාර්ගය පෙන්වා දීමටයි. දැන් ශ්‍රීමත් යතුර භාවිත කළ විට ඔබ ඉහළටම යාවි.

**ගීතය:** පහන් දැල්ල වෙනුවෙන් සලබයා සමූහයේදීම පිළිස්සී ගියේය.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා ආධ්‍යාත්මික දරුවන්ට ශ්‍රීමත් දෙනවා. කෙනෙකුගේ හැසිරීම හොඳ නැතිනම් ඔහුගේ දෙමාපියන් කියනවා: දෙවියන්ම ඔබට හොඳ උපදෙසක් දේවි කියලා. දෙවියන් ඇත්තටම උපදෙස් දෙනවාය යන්න දුප්පත් මිනිස්සුන්ට තේරෙන්නේ නැහැ. දරුවන් වන ඔබලා දැන් දේව උපදෙස් ලබමින් සිටිනවා. එනම්, ආධ්‍යාත්මික පියා දරුවන් වන ඔබලාව උසස් කරවීම සඳහා උසස් උපදෙස් ලබා දෙනවා. තමන් දැන් ඉතාමත් උසස්ම උසස් අය බවට පත් වෙනවා කියා ඔබලා දන්නවා. පියා අපට එවන් උසස් උපදෙස් ලබා දෙනවා. අප ඔහුගේ උපදෙස් අනුගමනය කර සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයේ සිට දේවතා තත්ත්වයට පත් වෙනවා. සාමාන්‍ය මනුෂ්‍යයින් දේවතාවරුන් බවට පත් කරවිය හැක්කේ පියාට පමණක්ය යන්න මින් ඔප්පු වෙනවා. මිනිසුන්ව දේවතාවරුන් බවට පත් කරවීමට දෙවියන්ට එතරම් කාලයක් ගත වුණේ නැහැයි කියා සික් ජාතිකයින් කියනවා. එමනිසා, ඔහු අනිවාර්යෙන්ම සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් දේවතාවරුන් බවට පත්වීමට ඔබට උපදෙස් ලබා දෙනවා. ඔහුගේ ගුණ ගායනා කර තිබෙනවා: අශාරීරික කෙනා සියල්ල කරන්නා. නිර්භීත කෙනා, ඔබ සැම කෙනෙක්ම නිර්භීත අය වෙනවා. ඔබ තමන් ජීව වශයෙන් සලකනවා නේද? ජීවයන්ට කිසිදු බියක් නැහැ. පියා කියනවා: නිර්භීත වන්න. බය වෙන්න මොනවාද තිබෙන්නේ? ඔබට කිසිදු බියක් නැහැ. ඔබ ගෙදර සිටිනා ගමන්ම පියාගෙන් දිගටම ශ්‍රීමත් ගන්නවා. ඒ කාගේ ශ්‍රීමත් ද? කවුද ඒවා දෙන්නේ? මේවා ගීතාවේ සඳහන්ව නැහැ. දරුවන් වන ඔබලාට දැන් මේ දේවල් තේරෙනවා. පියා කියනවා: ඔබලා අපිරිසිදු වෙලා. දැන් පාරිශුද්ධත්වයට පත් වීමට නම්, අඛණ්ඩව මා පමණක් සිහිපත් කරන්න. ඉතාමත් උසස්ම උසස් කෙනෙක් බවට පත් වීමට ඇති මෙම කණ්ඩායම සැදෙන්නේ සංගම යුගයේදී පමණයි. බොහෝ අය පැමිණ ශ්‍රීමත් ගන්නවා. මේකට කියන්නේ දෙවියන්ව මුණ ගැසෙනා මේලාව කියලයි. දෙවියන් අශාරීරිකයි. ජීව වන දරුවනුත් අශාරීරිකයි. තමා ජීවයක්ය යන දැඩි පුරුද්ද ඔබ තුළ හොඳින් ඇති කර ගත යුතුයි. සෙල්ලම් බඩුවක් යතුරකින් වයින් කළ විට නටන්න පටන් ගන්නවා. ඉතින් එමනිසා සෙල්ලම් බඩුවක් වැනි වූ මෙම ශරීරයට ඇති යතුර ජීවයයි. ශරීරය තුළ ජීවයක් නැති නම්, එයට කිසිවක් කරන්න බැහැ. ඔබලා ජීවමය සෙල්ලම් බඩුයි. සෙල්ලම් බඩුවක් යතුරකින් වයින් කළේ නැති නම්, ඉන් කිසි ඵලයක් නැහැ. එය එක තැන නතර වෙනවා. ජීවය කියන්නේ ජීවමය වූ යතුරක්. එය අවිනාශී හා අමරණීය යතුරකි. පියා පැහැදිලි කරනවා: මා බලන්නේ ජීවය දෙස පමණයි. ඇහුම්කන් දෙන්නේ ජීවයයි යන පුරුද්ද හොඳින් ඇති කර ගන්න. මෙම යතුර නැතිව ශරීරයට ක්‍රියාත්මක වෙන්න බැහැ. මොහුට අවිනාශී යතුරක් ලැබී තිබෙනවා. මෙම යතුර වසර 5000 ක් පුරා පවතිනවා. යතුර ජීවමය නිසා, චක්‍රයත් දිගින් දිගටම කැරකෙනවා. මෙම ශරීරය ජීවමය සෙල්ලම් බඩුවක්. පියාත් ජීවමය ජීවයක්. යතුර කැරකීම නතර වුණු විට, පියා පැමිණ නැවත අළුතින්ම මෙය කරනා ආකාරය ඔබට පෙන්වා දෙනවා. මා සිහිපත් කරන්න. යතුර කැරකේවි. එනම් කාර් එකක ටැංකිය හිස් වුණු විට එයට පෙට්‍රල් දමනවාක් සේ තමෝප්‍රධාන් තත්ත්වයෙන් ජීවය සතෝප්‍රධාන් වේවි. කොහොමද දැන් තමාව පෙට්‍රල් වලින් පුරවා ගන්නේ කියා දැන් ඔබ දන්නවා. බැටරියක් අක්‍රිය වුණු විට එහි ආලෝකය නිවී යනවා. ඔබගේ ජීවයේ බැටරිය දැන් නැවතත් පණ ගැන්වෙමින් තිබෙනවා. වැඩි වැඩියෙන් ස්මරණයේ නිරතව සිටිය තරමට, ජීවය තව තවත් බලයෙන් පිරෙනවා. උපත් 84 ක් ගනිමින් චක්‍රය වටා යන අතරේ බැටරිය හිස් වෙලා. ජීවය සතෝ, රජෝ හා තමෝ මට්ටම් පසුකර පැමිණ සිටිනවා. පියා දැන් පැමිණ සිටින්නේ නැවතත් වතාවක් යතුර කරකවා බැටරිය

පණ ගැන්වීමටයි. මිනිසුන් ලඟ කිසිම බලයක් නොමැති වුණු විට ඔවුන්ට වන්නේ කුමක්ද? බැටරිය දැන් ස්මරණයේ බලයෙන් නැවතත් පණ ගැන්විය යුතුයි. මේකට මානව බැටරියක් කියාත් කිව හැකියි. පියා කියනවා: මා හා යෝගා වන්න. මෙම ඥානය දෙන්නේ එකම එක පියා පමණයි. ජීවන මුක්තිය දානය කරන්නේ එකම එක පියා පමණයි. ඔබගේ බැටරිය දැන් සම්පූර්ණයෙන්ම පණ ගන්වා තිබෙනා අතර පසුව ඔබ සම්පූර්ණ උපත් 84 ටම චරිතයක් ලබනු ඇත. නාටකයක රූකඩ නටනවාක් සේ ජීව වන ඔබලාත් ඒ රූකඩ වගේයි. ඉහළ සිට පහළට පැමිණීමෙන්, ඔබලා දැන් වසර 5000 ක් අවසානයේ පහළටම පැමිණිලා. පියා දැන් නැවතත් පැමිණ සිටින්නේ ඔබව ඉහළ යැවීමටයි. එය සෙල්ලම් බඩුවක් පමණයි. ආරෝහණ තත්ත්වය හා අවරෝහණ තත්ත්වය ගැන පියා පැහැදිලි කර කියා දෙනවා: එය වසර 5000 ක කතාවක්. තමාව දැන් ශ්‍රීමත් නම් වූ යතුරින් වයින් කරවා ඇති බව ඔබලාට තේරෙනවා. අපි සම්පූර්ණයෙන්ම සතෝප්‍රධාන් වුණු විට නැවතත් මුළු චරිතය ආපසු ක්‍රියාත්මක වනු ඇත. මෙය තේරුම් ගැනීමට ඉතාමත් පහසු කරුණකි. ඒ වුණත් පියා කියනවා: මීර පෙර කල්පයේ දී මෙය අවබෝධ කර ගත් අය පමණයි නැවතත් වතාවක් අවබෝධ කර ගන්නේ. ඔබ කොපමණ ඔළුව වෙහෙසුවත් මීට වඩා දෙයක් ඔවුන් තේරුම් ගන්නා එකක් නැහැ. පියා සෑම කෙනෙකුටම පහදා දෙන්නේ එකම විස්තරයයි: ඔබ කොහේ අසුන් ගෙන සිටියත් පියාව සිහිපත් කරන්න. තමාගේ පව් දුරු වී යන්නේ පියාව සිහිපත් කිරීමෙන් පමණක් බව ඔබ දන්නවා. එමනිසා, ඔබ ඔහුව සිහිපත් කරමින් සිටිය යුතුයි. විශේෂයෙන්ම ස්මරණයටයි කියා විශේෂ කෙනෙක් ඔබ ලවා තැබීමේ අවශ්‍යතාවයක් නැහැ. කන බොන ගමන් ස්නානය කරන ගමන් සෑම විටකම පියාව සිහිපත් කරන්න. කවුරු හෝ කෙනෙක් ඔබ ඉදිරියට පැමිණ අසුන් ගනීවි. ඒ පුද්ගලයා ඔබට උදව් කරනවා නොවෙයි. ඔබ සෑම කෙනෙක්ම මේවා තනි තනියම කරගත යුතුයි. ඔබගේ බුද්ධිය දිව්‍යමය කර ගැනීමට කළ හැකි දේවල් ගැන දෙවියන් ඔබට උපදෙස් දී තිබෙනවා. ඔබලාට මෙහි රසය දී තිබෙනවා. ඔහු දිගටම සෑම කෙනෙක්ටම ශ්‍රීමත් දෙනවා. ඇත්තවශයෙන් ඇතැම් අයගේ බුද්ධිය ඉතාමත් තියුණුයි. පාරිශුද්ධ කෙනා වන එකම එක කෙනා සමඟ ඔබ යෝගා කළේ නැතිනම්. බැටරිය නැවත පණ ගැන්විය නොහැකියි. එවිට ඔබ පියාගේ ශ්‍රීමත් පිළිගන්නේත් නැහැ. ඔබට යෝගා කිරීමට හැකි වන්නේත් නැහැ. ඔබගේ බැටරිය දැන් පණ ගැන්වෙමින් තිබෙනා බව ඔබලාට දැනෙනවා. තමෝප්‍රධාන් තත්ත්වයෙන් ඔබ දැන් අනිවාර්යෙන්ම සතෝප්‍රධාන් විය යුතුයි. උත්තරීතර ජීවයෙන් ඔබ ශ්‍රීමත් ලබන්නේ මෙන්න මේ කාලයේදියි. ලෝකයට මෙය කිසිසේත්ම තේරෙන්නේ නැහැ. පියා කියනවා: මගේ මෙම උපදෙස් මඟින් ඔබ දේවතාවරුන් වෙනවා. මෙයට වඩා තවත් ඉහළ දෙයක් නැහැ. මේ ඥානය එහේ නැහැ. මෙම නාටකය කල්තබාම තීරණය වූවකි. ඔබව උසස්ම උසස් අය බවට පත් කරවීමට පියා පැමිණෙන්නේ සංගම යුගයේදී පමණයි. මෙහි ස්මාරකය භක්ති මාර්ගයේ පෙන්වා තිබෙනවා. මිනිස්සු දෂේරාව සමරනවා (රාවණ්ගේ පඹයෙක් සාදා පිළිස්සීමේ උත්සවය). දෂේරාව එන්නේ පියා පැමිණි විටයි. සියල්ල වසර 5000 කට වරක් ක්‍රියාත්මක වෙනවා. ඔබව උසස් කරවනා උසස් උපදෙස් ලබන්නේ දරුවන් වන ඔබලා පමණයි. ජීව වන ඔබලා සතෝප්‍රධාන්ව සිටියා. පසුව ටිකෙන් ටික පහළට එන ගමන්, ඔබ තමෝප්‍රධාන් වී පරිහාණියට පත් වුණා. පියා දැන් ඔබට ඥානය හා යෝගාව උගන්වා ඔබලාව සතෝප්‍රධන් හා උසස් අය බවට පත් කරවනවා. ඔබ ඉණිමඟේ පහළට පැමිණියේ කෙසේද කියා ඔහු පෙන්වා දෙනවා. නාටකය දිගටම ඉදිරියට යනවා. මෙම නාටකයේ මුල, මැද හා අග ගැන කිසිම කෙනෙක් දන්නේ නැහැ. පියා ඔබට නාටකය ගැන කියා දී තිබෙනා නිසා ඔබට දැන් එය මතකයි. එකිනෙකාගේ ජීවන කථාව කියන්න ඔහුට හැකියාවක් නැහැ. ඔබට කියවා කියා දීමට කියා එය ලියා තබන්න බැහැ. පියා මෙහි සිට ඔබට මෙය පැහැදිලි කර කියා දෙනවා. ඔබලා දැන් බ්‍රහමින්වරුන් වී පසුව දේවතාවරුන් බවට පත් වෙනවා. පියා පැහැදිලි කර කියා දී තිබෙනවා: මම ආගම් තුනම ස්ථාපනය කරනවා. බ්‍රාහ්මන, දේවතා හා ක්ෂත්‍රිය. තමන් පියා හරහා බ්‍රහමින් වංශයට අයිති වීමට පැමිණ සිටිනවාය කියා ඔබලා දැන් දන්නවා. පසුව ඔබලා සූර්ය වංශයේ හා චන්ද්‍ර වංශයේ කොටස් බවට පත් වේවි. පරාජය වන අය චන්ද්‍ර වංශයේ කෙනෙක් බවට පමණයි පත් වන්නේ. පරාජය වන්නේ කුමන විෂයෙන්ද? යෝගාවෙන්: උපත් 84 ක් ගැනීමේ ඥානය ඉතාමත් පහසුවෙන් ඔබට පහදා දී තිබෙනවා. මිනිස්සු උපත් මිලියන 8.4 ක් ගැන කතා කරනවා. ඒ නිසා ඔවුන් බොහෝ ඈතට ගිහින්. ඔබට දැන් ලැබෙන්නේ දේව උපදෙසුයි. දෙවියන් පැමිණෙන්නේ එකම එක වතාවයි. එමනිසා ඔබට ඔහුගේ උපදෙස් ලැබෙන්නේත් එක වතාවයි. තිබුණේ එකම එක දේවතා ධර්මයකි. මීට පෙර තිබුණේ සංගම යුගයයි. ඔවුන් අනිවාර්යෙන්ම දෙවියන්ගේ උපදෙස් ලැබුවා. පියා පැමිණ ලෝකය වෙනස් කරනවා. ඔබ දැන් වෙනස් වෙනවා. පියා ඔබලාව වෙනස් කරවන්නේ මෙන්න මේ කාලයේදියි. තමන් සෑම කල්පයකදීම වෙනස් වෙමින් පැමිණි බවත් දිගටම ඉදිරියටත් වෙනස් වෙන බවත් ඔබ කියනවා. මේ බැටරිය සජීවී වන අතර ඒ බැටරිය අජීවියි. පියා පැමිණ සිටින්නේ වසර 5000 කට පසුව බව දරුවන් වන ඔබලාට දැන්

තේරෙනවා. ඔහු ඔබට දෙන්නේ ඉතාමත් උසස්ම උසස් උපදෙසුයි. ඉහළම ඉහළ දෙවියන් ගෙන් ඔබට උසස් උපදෙස් ලැබෙනවා. ඉන් ඔබ උසස් තත්ත්වයක් දිනා ගන්නවා. කෙනෙක් ඔබ ලඟට පැමිණි විට ඔබ දෙවියන්ගේ දරුවෙක් නේද කියා අසන්න. දෙවියන් යනු ශිව බාබායි. ඔවුන් ශිවාගේ උපන් දිනය සමරනවා. ඔහු ජීවන මුක්තිය ලබා දෙන්නාත් වෙනවා. ඔහුට තමාගේම කියා ශරීරයක් නැහැ. එසේනම් ඔහු උපදෙස් දෙන්නේ කවුරුන් හරහා ද? ඔබත් ජීවයක් වන අතර ඔබ කතා කරන්නේ ඔබගේ ශරීරය හරයායි. ශරීරයකින් තොරව ජීවයකට කිසිවක් කරන්න බැහැ. අශරීරික පියා එන්නේ කෙසේද? ඔහු රථයකට පැමිණෙන බව සඳහන් වී තිබෙනවා. මේ සියල්ල ගැන එක් එක් අය එක එක කතාන්දර හදා තිබෙනවා. සූක්ෂම ලෝකයේ ත්‍රිමූර්ති පින්තූරය පෙන්වා තිබනවා. පියා පැහැදිලි කර කියා දෙනවා: ඒ සියල්ල දර්ශන හා සම්බන්ධ කරුණුයි. කොහොමනමුත්, මුළු නිර්මානයම මෙහි තිබෙනවා. එමනිසා, පියා, නිර්මාපකයා ද පැමිණ සිටිනවා. ඔබව පාරිශුද්ධ කරවීම සඳහා ඔහු මෙම අපිරිසිඳු ලෝකයට පැමිණිය යුතුයි. මෙහිදී ඔහු දරුවන් වන ඔබලාව කෙලින්ම පාරිශුද්ධත්වයට පත් කරවනවා. ඔබට මෙය තේරෙනවා. ඒත් ඥානය හරියට සිහියේ රැඳෙන්නේ නැහැ. කිසිම කෙනෙකුට පහදා දීමේ හැකියාව ඔබට නැහැ. ඔබ ශ්‍රීමත් අනුගමනය නොකරනා නිසා ඔබට උසස්ම උසස් කෙනෙක් බවට පත් විය නොහැකියි. කිසිම දෙයක් නොතේරෙන අය මොන වගේ තත්ත්වයක් ද ලබා ගන්නේ? වැඩි වැඩියෙන් සේවය කළ තරමට ඔබ ලබනා තත්ත්වයත් උසස් වනු ඇත. පියා කියා තිබෙනවා: සේවය සඳහා ඔබගේ ඇට මිදුළු දානය කරන්න. සෑම සේවයක්ම කරන්න. සේවය සඳහා අපේ ඇට මිදුළු සියල්ල දානය කිරීමට අප සූදානම්. දරුවන් බෙහෝ දෙනෙක් සේවය කිරීමේ මහත් ආසාවෙන් සිටිනවා. බාබා, අපව නිදහස් කරන්න. එවිට අපට බොහෝ දෙනෙකුට යහපත සැලසෙන ආකාරයේ සේවාවන් රැසක්ම කළ හැකියි. මුළු ලෝකයම භෞතික සේවාවන් කළත් එමඟින් ඔවුන් පහළට පැමිණීම පමණයි සිදු වුණේ. දැන් මෙම ආධ්‍යාත්මික සේවය මඟින් ආරෝහණ තත්ත්වය කරා ඔබ යනවා. කෙනෙක් තමාට වඩා වැඩියෙන් සේවය කරනා විට ඔබ ඕනෑම කෙනෙක්ට එය අවබෝධ කර ගත හැකියි. ඇතැම් දියණියන් ඉතමත් හොඳයි. සේවයට ලැදියි ඒ නිසා ඔවුන්ට පුළුවන් මධ්‍යස්ථානයක් බලා කියා ගන්න. අනිත් පාසල් වල පන්තියක අසුන් ගන්නේ අංක පිළිවෙලටයි. මෙහිදී එහෙම වාඩි වෙන්න කියා කියන්නේ නැහැ. එහෙම කිව්වොත් ඔබගේ හද ගැස්මත් නවතීවි. ඔබට මෙය තේරුම් ගත හැකියි. සේවය කළේ නැතිනම්, ඔබගේ තත්ත්වය අනිවාර්යයෙන්ම පහළ යාවි. අංක පිළිවෙලට සැදුණු මට්ටම් ගණනාවක්ම තිබෙනවා. කොහොමනමුත්, එය සතුටේ දේශය වන අතර මෙය දුකෙහි දේශය වෙනවා. එහි කිසිදු රෝගයක් නැහැ. සෑම දෙයක් සම්බන්ධයෙන්ම ඔබගේ බුද්ධිය පාවිච්චි කළ යුතුයි. තමන් සේවය නොකරනා නිසා තමන්ට ලැබෙන්නේ ඉතාමත් අඩුම තත්ත්වයක් කියා එවිට ඔබට අවබෝධ කර ගත හැකි. හොඳ තත්ත්වයක් දිනා ගත හැක්කේ සේවය කිරීමෙන් පමණයි. තමාව පරීක්ෂා කර බලන්න. ඔබ සෑම කෙනෙක්ම තම තමන්ගේ තත්ත්වය ගැන හොඳින් දන්නවා. මමා හා බාබාත් සේවය කරමින් සිටියා. ඉතාමත් හොඳ දරුවනුත් සිටිනවා. රැකියාවක නිරත වුණත් වරුවක පඩියට වැඩ කර සේවය සඳහා සම්බන්ධ වෙන්න කියා ඔවුනට කියනවා. එහි කිසිම වැරැද්දක් නැහැ. බාබාගේ හද සිහසුන මත අසුන් ගත් අය පසුව මොණර සිහසුන මත අසුන් ගන්නවා. ඒත් ඔවුන් දරණ උත්සාහයේ පිළිවෙලටයි. ජයග්‍රහණයේ මාලාවට ඔබත් එකතු වන්නේ මෙන්න මේ ආකාරයෙනුයි. ඔබ තමාව කැප කරවා සේවයත් හොඳින් කරනවා. බාබාගේ සේවය වෙනුවෙන් කැප වුණත් පසුව සේවය කරන්නේ නැතිනම් ඔබගේ තත්ත්වය පහළ බහිනවා. අධිරාජ්‍යයක් ස්ථාපනය වන්නේ ශ්‍රීමත් මඟිනුයි. මීට පෙර මෙය අසා තිබෙනවා ද? අධ්‍යාපනයක් තුළින් අධිරාජ්‍යයක් ස්ථාපනය කරනවාය කියා දෙයක් ගැන ඔබ මීට පෙර අසා තිබෙනවාද, දැක තිබෙනවාද? දාන මානාදිය දෙමින් හා පින් දහම් කිරීමෙන් ඔබට රජ කෙනෙකුට දාව උපත ලද හැකියි. කොහොමනමුත්, ඉගෙන ගැනීමෙන් උසස් තත්ත්වයක් දිනා ගත හැකියි කියා දෙයක් ගැන ඔබ කවදාවත් අසා නැහැ. කිසිම කෙනෙක් මේ ගැන දන්නේ නැහැ. පියා පැහැදිලි කරනවා: ඔබ සම්පූර්ණ උපත් 84 ම ගන්නවා. දැන් ඔබට ඉහළට යා හැකියි. මෙය ඉතාමත් පැහැදිලියි. තම තමන්ගේ උත්සාහයන්ගේ තරමට ඔබට මෙය සෑම කල්පයකදීම අවබෝධ වෙනවා. පියාත් ඔබව ආදරයෙන් මතක් කරන්නේ ඔබ දරණ උත්සාහයේ තරමටයි. සේවයේ කාර්ය බහුලව නිරත වී සිටිනා අයව ඔහු ඉතාමත් සෙනෙහසින් සිහිපත් කරනවා. එමනිසා, තමන් ඔහුගේ හද සිහසුන මත අසුන් ගෙන සිටිනවා ද නැද්ද කියා පරීක්ෂා කර බලන්න. මට මාලාවේ කොටසක් බවට පත් විය හැකිද? නූගත් අයට උගත් අය ඉදිරියේ දණ නැමීමට සිදු වේවි. පියා කියනවා: දරුවනි, උත්සාහ දරන්න. කොහොමනමුත්, එය ඔවුනගේ නාටකයේ නැතිනම්, ඔබ කොපමණ ඔළුව ගසා ගත්තත් ඔවුන්ට එය දිනා ගැනීමට හැකි වන්නේ නැහැ. ශාරීරික අවධානය තුළින් කුමන හෝ ආකාරයක නරක අපලයක් පැමිණ අනිකුත් පාපයනුත් ඉන් ඇතුළු වෙනවා. ප්‍රධානම උග්‍රම රෝගය නම් ශාරීරික අවධානයයි. සත් යුගයේ දී ශාරීරික අවධානයේ සඳහනක් නැහැ. එහි

ඔබට ලාභය ලබා ගත හැකියි. පියා මෙය පැහැදිලි කරන්නේ මෙහිදීයි. තමා ජීවයක් වශයෙන් සලකා අඛණ්ඩව පියාව සිපත් කරන්න කියන ශ්‍රීමත් වෙන කිසිම කෙනෙක්ට දෙන්න බැහැ. ප්‍රධානම දෙය මෙයයි. මා පමණක් සිහිපත් කරන්න. තමා ජීවයක් බව සලකන්න. තම ශරීරය පවා සිහිපත් කරන්න එපා කියා අශාරීරික දෙවියන් පවසයි යැයි ඔබ ලිවිය යුතුයි. භක්ති මාර්ගයේ දී ශිවාව පමණක් සිහිපත් කරන්නාක් සේ දැන් ඔබට ඥානය දෙන්නේ මා පමණයි. අන් සියල්ල භක්තියයි. පිරිසිදුම ඥානය ඔබ ලබන්නේ ශිව බාබාගෙන් පමණයි. මෙම මුතු මැණික් මතු වන්නේ ඥාන සයුරෙනුයි. එය ඒ සාගරය හා සම්බන්ධ කරුණක් නොවෙයි. මෙම ඥානයේ සාගරය ඔබව දේවතාවරුන් බවට පත් කරවනා ඥානයේ මිණිමුතු දෙනවා. ග්‍රන්ථ වල ලියා ඇත්තේ මොනවාද කියා බලන්න. සාගරයකින් දේවතාවරුන් මතු වී මුතු මැණික් දෙන බව පෙන්වා දෙනවා. මෙම ඥානයේ සාගරය දරුවන් වන ඔබලාට මුතු මැණික් දෙනවා. ඔබ ඥානයේ මුතු මැණික් අහුලා ගන්නවා. මීට පෙර ඔබ අහුලා ගත්තේ ගල් කැට කී නිසා ඔබ ගේ බුද්ධියත් ගල් බුද්ධියක් වී තිබෙනවා. දැන් මේ මුතු මැණික අහුලා ගැනීමෙන් ඔබ දිව්‍යමය බුද්ධියක් ඇති අය බවට පත් වෙනවා. ඔබලා දිව්‍යත්වයේ දෙවියන් වෙනවා. දිව්‍යත්වයේ දේවතාවරුන් වන ලක්ෂ්මි හා නාරායන් ලෝක පාලකවරුන් සේ සිටියා. භක්ති මාර්ගයේ දී ඔවුන් විවිධාකාර නම් හා රූප ගණනාවක් සෑදුවා. ඇත්තෙන්ම කියනවා නම් ලක්ෂ්මි හා නාරායන් සහ දිව්‍යත්වයේ දේවතාවරුන් දෙකම එකයි. පෂුපතිනාත් වෙනුවෙන් නේපාලයේ පැවැත්වෙන මේලාවත් දිව්‍යත්වයේ දේවතාවරුන් වෙනුවෙනුයි. අච්ඡා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පියා විසින් ඔබට දෙනු ලබනා මෙම ඥානයේ මුතු මැණික් පමණක් අහුලා ගන්න. ගල් අහුලා ගන්න එපා. ශාරීරික අවධානය නම් වූ දැඩි රෝගයෙන් තමාව ආරක්ෂා කර ගන්න.
2. ඔබගේ බැටරිය මුළුමනින්ම චාජ් කර ගැනීමට නම් ශක්ති බලාගාරය වන බාබා සමඟ යෝගාව තබා ගන්න. ජීවාත්ම අවධානයෙන් සිටීමට උත්සාහ කරන්න. නිර්භයව සිටින්න.

**වරදානය:**

**පාඨය: අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

***** ඕම ශාන්ති *****

කර්මතීත් වීමට නම්, කර්මයේ ගිණුම් වලින් නිදහස් වන්න. සේවය කිරීමේ දී, කිසිදු සේවා බන්ධනයකින් බැඳී සිටින සේවකයෙකු නොවන්න. බන්ධනයෙන් නිදහස්ව සිටියදී සේවය කරන්න, එනම්, සීමිත රාජකීය ආශාවන්ගෙන් නිදහස් වන්න. ශරීරයේ බන්ධන සහ ශරීරයේ සම්බන්ධතා වල බන්ධන ඇත. ඒ හා සමානව, ඔබ කරන සේවයේ ආත්මාර්ථකාමිත්වය ද බන්ධනයකි, එය ඔබට කර්මතීත් වීමට බාධා ඇති කරයි. කර්මතීත් වීම යනු මෙම රාජකීය කර්ම ගිණුම් වලින් නිදහස් වීමයි.